තේමා ලිපි

# කිමද දෙහි මිල ඉහළගිය කාරණා?

ලංකාවේ ප්‍රධාන දෙහි නිෂ්පාදන ප්‍රදේශ ලෙස මොනරාගල, හම්බන්තොට, ඇඹිලිපිටිය, තිස්ස, තිකවැරටිය, වැල්ලවාය, බලංගොඩ, මීද්දෙනිය සහ බිබිල යන ප්‍රදේශ හඳුන්වන්න පුළුවන්. මේ අතරිනුත් වැදගත් ස්ථානයක් ගන්නේ මොනරාගල දිස්ත්‍රික්කයයි. ඒත් එම ප්‍රදේශයෙන් ලැබෙන තොරතුරු අනුව දෙහි වගාවට අභාග්‍ය සම්පන්න කාලයක් උදාවෙලා ඇති බවයි පේන්නේ. දෙහි විතරක් නෙමෙයි අනෙක් පැහිරි වගාවල තත්ත්වයත් මේකයි. බිබිල දොඩම් සඳහා රටේ ඉමහත් ප්‍රසිද්ධියක් පැවතුනා. ඒත් දැන් බිබිල දොඩම් ඇත්තෙම නැති තරම්.

සමහර වෙලාවට අතමිට හිඟ වුනාම පොල් සම්බෝලෙකින් වේල පිරිමහගන්නත් වෙනවා. පොල් සම්බෝල කොහොම හැදුවත් දෙහි ඇඹුල් නැතුව නම් රස නැහැ. ඒ වගේම තමයි දෙහි ඇඹුලෙන් බොහෝ අවස්ථාවලදී කෑම රසවත් වෙනවා. ඒ විතරක් නෙමෙයි දෙහි හොඳ බෙහෙතක් විදිහට සහ හොඳ පලතුරක් විදිහටත් සලකනවා. ඒත් පහුගිය කාලේ වෙළඳපොල දිහා බැලුවම (මැයි, ජූනි, ජූලි, අගෝස්තු,)එළවළුවලටත් වඩා මිළක් වැය කරන්න වෙලා තියෙන්නේ දෙහි මිළදී ගන්න. දෙහි මිළ පාරිභෝගිකයාට දරාගන්න බැරි තරමට ඉහළ ගියා. 1998 ජූනි තුන්වන සතිය වනවිට කොළඹ වෙළඳපොලවල දෙහි කිලෝවක උපරිම සිල්ලර මිළ රු.250.00 ක් වෙලා තිබුණා. අවම සිල්ලර මිළ රු. 160.00 ක් වුණා. නිදසුනක් විදිහට පසුගිය වසර දෙක සමඟ මෙම වසර සැසඳීමේදී මෙසේ දක්වන්න පුළුවන්


හෙ.ගො.ප.පු. ආයතනයේ
අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශයේ
පී.එම්.එල්.පී. නයනදර්ශනී විසිනි.


| | මිළ පරාසය රු. (කිලෝ 1ක් සඳහා) | සාමාන්‍යය |
|---|---|---|
| 1996 ජූනි 3 සතිය | 60.00-90.00 | 75.56 |
| 1997 ජූනි 3 සතිය | 55.00-75.00 | 71.60 |
| 1998 ජූනි 3 සතිය | 160.00-250.00 | 200.40 |

(ආහාර ද්‍රව්‍ය විවරණිකාව ඇසුරෙන්)


කොළඹ සහ අවට වෙළඳපොලවල සිල්ලර මිළ ගණන් මෙසේ විමසා බලන විට 1998 වසරේ දෙහි මිළ ගණන් සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති බව පේනවා. නිදසුනක් විදිහට පහත දත්ත සහ ප්‍රස්තාරයෙන් දෙහි මිළ ගණන් ඉහළයාම පෙන්වන්න පුළුවන්

**කොළඹ හා අවට සිල්ලර වෙළඳපොළ වල දෙහි සඳහා පැවති මිළ (කිලෝවකට රුපියල්)**

| මාස | 1996 | 1997 | 1998 |
|---|---|---|---|
| ජන | 50.88 | 37.54 | 67.33 |
| පෙබ | 43.09 | 26.70 | 58.29 |
| මාර්තු | 38.85 | 29.51 | 59.90 |
| අප්‍රේල් | 45.28 | 59.87 | 114.75 |
| මැයි | 52.81 | 68.50 | 178.21 |
| ජූනි | 70.93 | 70.12 | 199.27 |
| ජූලි | 63.13 | 54.19 | 178.38 |
| අගෝ | 60.14 | 39.30 | 101.24 |
| සැප් | 74.49 | 37.34 | 69.88 |
| ඔක් | 99.16 | 42.64 | |
| නොවැ | 101.21 | 54.69 | |
| දෙසැ | 65.04 | 74.27 | |

## මේ වසරේ දෙහි මිළ මෙතරම් ම ගණන් ගියේ ඇයි?

ලංකාවේ ප්‍රධාන දෙහි නිෂ්පාදන ප්‍රදේශ ලෙස මොනරාගල, හම්බන්තොට, ඇඹිලිපිටිය, තිස්ස, තිකවැරටිය, වැල්ලවාය, බලංගොඩ, මීද්දෙනිය




මූලාශ්‍රය : අලෙවි හා ආහාර ප්‍රතිපත්ති අංශය.

සහ බිබිල යන ප්‍රදේශ හඳුන්වන්න පුළුවන්. මේ අතරිනුත් වැදගත් ස්ථානයක් ගන්නේ මොනරාගල දිස්ත්‍රික්කයයි. ඒත් එම ප්‍රදේශයෙන් ලැබෙන තොරතුරු අනුව දෙහි වගාවට අභාග්‍ය සම්පන්න කාලයක් උදාවෙලා ඇති බවයි පේන්නේ. දෙහි විතරක් නෙමෙයි අනෙක් පැහිරි වගාවල තත්ත්වයත් මේකයි. බිබිල දොඩම් සඳහා රටේ ඉමහත් ප්‍රසිද්ධියක් පැවතුනා. ඒත් දැන් බිබිල දොඩම් ඇත්තේම නැති තරම්. 1997 පෙබරවාරි මාසය වනවිට මොනරාගල දිස්ත්‍රික්කයේ මුළු දෙහි නිෂ්පාදනය මෙ.ටො. 1,038 ක් වී තිබුණා. මෙය 1998 පෙබරවාරි මාසය වනවිට 40% කින් පමණම පහළ බැහැලා. මේ තත්ත්වයට හේතු කිහිපයක්ම බලපා ඇති බව පේනවා. එනම්,

*. දෙහි වගාව සඳහා වාණිජ මට්ටමේ වැඩ පිළිවෙළක් තවමත් ක්‍රියාත්මක නොවීම.

*. 1985න් පසුව දෙහි ඇතුළු පැහිරි බෝග රාශියකට වැළඳුනදිලීර රෝග සම්බන්ධව ස්ථිර මර්දන වැඩ පිළිවෙළක් සකස් නොවීම.

*. දෙහි වගා ව්‍යාප්තියට අනුව වෙළඳපොලක් පිළියෙළ නොවීම (මේ අනුව වසරේ වැඩිම දෙහි නිෂ්පාදනයක් සිදුවන ජනවාරි මාර්තු යන කාලය තුළ මිළ පහළ බැසීම අනිවාර්යයෙන් සිදුවේ.)

* මෙම වසරේ හටගත් එල්නිනෝ බලපෑම මත දිස්ත්‍රික්කයේ ප්‍රධාන දෙහි වගා කලාප වන මඩුල්ල, සියඹලාණ්ඩුව, බිබිල, මැදගම, මොනරාගල යන ප්‍රදේශවල වගාවන්ගේ ගෙඩි හටගනු නොලැබීම.

* දෙහි ඇතුළු පැහිරි බෝග වගා සියල්ලකගේම වගාවකට පොහොර සහ ජල සැපයුම් ක්‍රම නඩත්තු පිළිවෙත් අනුගමනය නොකිරීම.

සාමාන්‍ය වශයෙන් බලන කල දෙහි සඳහා වර්ෂයේ ඉහළම මිළක් වාර්තා වෙන්නේ ජූනි,ජූලි සහ ඔක්තෝබර් මාසවල. ඒත් මේ තරමම පහුගිය වසරේ දෙහි මිළ ගණන් ඉහළ ගියේ නැහැ. පසුගිය වසරේ ජූනි තුන්වන සතිය සමඟ මෙම වසරේ ජූනි තුන්වන සතිය සැසඳීමේදී දෙහි සිල්ලර මිළ ගණන් 180%කින් පමණම වැඩිවෙලා. තොග මිළ ගණන් 287%කින් වැඩිවෙලා. ඉතින් දෙහි වගාව වෙනුවෙන් ස්ථිරසාර විසඳුමක් නොයෙදුවොත් මේ අභාග්‍යසම්පන්න තත්ත්වයෙන් දෙහි වගාව ආරක්ෂා කර ගැනීමට හැකිවෙයිද? දෙහි වගාවේ අනාගතය කෙබඳු වෙයිද?

(මෙම ලිපිය සැකසීමේදී ප්‍රස්තාරය ඇඳීමෙන් සහ දත්ත සැපයීමෙන් සහාය දැක්වූ සංඛ්‍යාන සහකාර කේ.ඒ. රංජිත් පත්මසිරි මහතාට ද තොරතුරු ලබාදීමෙන් සහාය දැක්වූ මොනරාගල විමර්ශන නිලධාරි ජී.ජී. සමරසිංහ මහතාටද ස්තුතිවන්ත වෙමි.)